Alcohol and Drug Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 5, Sri Lanka.
Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484
E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk
Web Site: http://www.adicsrilanka.org


2017. 06.27

මාධ්‍ය නිවේදනයයි.

2017.06.22 දින පාර්ලිමේන්තුවේ සුරාබදු ආඥාවන් වෙනස් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා ගෙන ඇති ස්ථාවරය, පාර්ලිමේන්තුවේ සිදුකළ ප්‍රකාශයන්ට අදාලව පළව තිබූ පුවත්පත් වාර්තා සහ පාර්ලිමේන්තුවේ සජීවී පටිගත කළ දර්ශනවල පහත මතයන් ප්‍රකාශවී තිබුණි.

1. මත්පැන් සමාගම් සදහා පනවා ඇති මද්‍යසාර නිෂ්පාදන බද්ද මිලියන 100 සිට මිලියන 01 දක්වා අඩු කළයුතු බව,

2. බියර් සහ වයින් මිල ඉහළ බවත් එහි මිල අඩුකර ජනතාවට සහනයක් ලබාදිය යුතු බවත්,

3. එමගින් සැර මත්පැන් භාවිතය සහ කසිප්පු භාවිතය අවම කිරීමට හැකියැ'යි පුද්ගලිකව විශ්වාස කරන බව,

4. නිවාඩු දිනයන්හි මත්පැන්හල් වැසීම නිසා කසිප්පු සහ නීත්‍යානුකූල නොවන මත්පැන් අලෙවිය වැඩිවන බවත්,

5. විදේශිකයන්ට නිවාඩු දිනයන්හි මත්පැන් අලෙවි කිරීමට නොහැකිවීමෙන් ඔවුන් නැවත ලංකාවට නොපැමිණෙන බැවින් පොහොය සහ නත්තල් දිනවල සුරාසැල් විවෘත කිරීමට අදහස් කරන බවත්ය.

මෙම යෝජනා සහ අදහස් මුදල් අමාත්‍යවරයාට නිවැරදි තොරතුරු ලබානොදීම හෝ හිතාමතාම කිසියම් පාර්ශවයක් මගින් මුදල් අමාත්‍යවරයාව නොමග යැවීමට කටයුතු කිරීමෙන් ඇතිවූ ප්‍රතිඵලයක් බව අපගේ විශ්වාසයයි. පසුගිය වසරේ සිගරට් මත බදු වැඩිකිරීම හා වැට් බදු පැණවීම සිදුකිරීමට යෝජනාවූ අවස්ථාවේදීද මෙලෙසම සූක්ෂම ලෙස මුදල් අමාත්‍යංශය මගින් මුදල් ඇමතිවරයා නොමග යැවීමට සාවද්‍ය තොරතුරු ලබාදීම සිදුකර තිබූ අතර, එම සාවද්‍ය තොරතුරු ධවල පත්‍රිකාවක් ලෙස කැබිනට් මණ්ඩලයට ද ඉදිරිපත් විය. ඒ අනුව, මද්‍යසාර සම්බන්ධයෙන් මෙසේ ඉදිරිපත්වී ඇති යෝජනා සලකා බලමු.

මත්පැන් නිෂ්පාදන සමාගම් මත පනවන බදු ප්‍රමාණය පසුගිය අයවැය වාර්තාව මගින් ඉහළ දැමුවේ මද්‍යසාර වැනි අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයන් මත වැඩි බදු ප්‍රතිශතයක් පනවා එමගින් ලැබෙන බදු ආදායම වැඩිකර ගනීමටය.

1. මත්පැන් සමාගම් සඳහා පනවා ඇති මද්‍යසාර නිෂ්පාදන බද්ද මිලියන 100 සිට මිලියන 01 දක්වා අඩු කිරීම තුලින් රජයට ලැබීමට තිබෙන විශාල බදු ප්‍රමාණයක් මෙම යෝජනාව තුලින් අහිමිවේ. ශ්‍රී ලංකාවේ පසුගිය වසර කිහිපය තුල රාජ්‍ය ආදායම ඉහළ නොගිය සහ රජයේ වියදම් අධික ලෙස ඉහළ ගිය වකවානුවක මත්පැන් නිෂ්පාදන සමාගම් මත නිෂ්පාදන බදු අඩුකිරීම කිසිදු ආකාරයකින් සාධාරණීකරණය කළ නොහැකිය. එමනිසා මෙම යෝජනා තුලින් සිදුවන්නේ බදු ලෙස රජයට ලබාගත හැකි මුදල් අවසාන වශයෙන් මද්‍යසාර සමාගම්වල ආදායම් වැඩිකිරීමට දායකවීමයි.

2. ජනතාව බලාපොරොත්තුවන්නේ, බියර් සහ වයින් මිල අඩුකර ජනතාවට සහන ලබාදීම නොව අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන්වල මිල තවදුරටත් ඉහළ නොයවා ඒවා පාලනය කිරීමය. අපේ රටේ මද්‍යසාර භාවිතා කරන්නන්ගේ ප්‍රමාණය සමස්ත පිරිමි ජනගහනයෙන් 35% කි. (STEPS Survey/WHO & Ministry of Health, Sri lanka) මද්‍යසාර භාවිතාකරන්නන් ද සිය දරුවන් මද්‍යසාර වැනි අවාසිදායක පුරුද්දකට ගොදුරුවනවාට කැමැත්තක් නොදක්වයි. 2015 වසරේ ලෝක සෞඛ්‍ය සංවිධානය හා සෞඛ්‍ය අමාත්‍යංශය එක්ව සිදුකරන ලද අධ්‍යනයකට අනුව වසරකදී මද්‍යසාර භාවිතය නිසා අපේ රටට සිදුවන ගණනය කළ හැකි අලාභයේ වටිනාකම පමණක් රු. බිලියන 141 ක් වේ. එසේනම් සිදුකළ යුත්තේ රටේ අධ්‍යාපනයට, සෞඛ්‍යට සහ සංවර්ධනයට රජය වැඩි වශයෙන් ආයෝජනය කිරීම මිස බියර් සහ වයින් මිල අඩු කිරීම මගින් සමස්ත හානිය වැඩිකර ගැනීමට කටයුතු කිරීම නොවේ. මෙම යොජනාව ක්‍රියාත්මකවීම මගින් සිදුවන්නේ ළමුන් සහ තරුණයන් මද්‍යසාරවලට යොමුවීමට තිබෙන අවකාශ පුළුල්වීමයි.

3. බියර් මිල අඩු කිරීමෙන් කසිප්පු භාවිතය සහ සැර වැඩි මද්‍යසාර භාවිතය අවම කළ හැකියි යන්න විද්‍යාත්මකව සත්‍යතාවයක් නොමැති කරුණකි. 1995 වසරේදී ද එවකට මුදල් අමාත්‍යවරයාව සිටි ජී. එල් පීරිස් මහතා විසින් මෙවැනිම තර්ක ඉදිරිපත් කරමින් බියර් බදු අධික ලෙස අඩුකිරීමට කටයුතු කළත් රජයේ අපේක්ෂාවන් ඉටුනොවුණු අතර, මෙමගින් බියර් අලෙවිය අධික ලෙස වැඩිවූ අතර බියර් මගින් උපයා ගත හැකිව තිබූ විශාල බදු ප්‍රමාණයක්ද රටට අහිමි විය. එමෙන්ම, එමගින් සැර මද්‍යසාර භාවිතයේ ද කිසිදු අඩුවක් නොවූ බව සමීක්ෂණ දත්තවලින් පැහැදිළි විය.

කිසිම මද්‍යසාරයක මිල අඩු කිරීම මගින් හානිය අවම කිරීම සිදුකළ නොහැකිය. මන්ද, මිල අඩුවීමෙන් එම භාවිතය වැඩිපුර සිදුකිරීමට යොමුවන්නේද අසරණ දුප්පත් ජනතාවමය. ඔවුන්ගේ ජීවන තත්වයන් ඉහළ දැමීමට මෙවන් තීරණ මගින් ඍණාත්මක බලපෑමක් ඇතිකරනු ලබයි. අරක්කු මිල ඉහළ දැමීමෙන් කසිප්පු වැනි නීති විරෝධී මද්‍යසාර භාවිතය ඉහළ යන බවට කිසිදු සමීක්ෂණ වාර්තාවකින් තහවුරුවී නොමැත. රටක නීතිවිරෝධී දෑ පාලනය කිරීමට ඊට අදාල පියවර ගතයුතු අතර නීත්‍යානුකූල භාණ්ඩයක මිල පහළ දැමීමෙන් නීතිවිරෝධී දෑ පාලනය කළ නොහැකිය.

4. පොහොය දින තැබෑරුම් වසා තැබීම හෝ විවෘතව තැබීම සම්බන්ධයෙන් අපගේ ස්ථාවරය නම්, විද්‍යාත්මක සාක්ෂි පෙන්වාදෙන පරිදි, මද්‍යසාර සුලභතාවය සීමා කිරීමට හැකි සෑම ආකාරයක්ම සමස්ත භාවිතය අඩුවීමට බලපෑමක් සිදුකරන බවයි. එවන් සීමා පැනවූ පොහොය හෝ වෙනත් දිනයන්හිදී නීතිවිරෝධී හෝ නීත්‍යානුකූල නොවන අයුරින් සිදුකරන මද්‍යසාර විකිණීම නතර කළ හැක්කේ අදාල නීතිය ක්‍රියාත්මක කරන ආයතන යුහුසුළුව ක්‍රියාත්මකවීමෙනි.

5. අපේ රටේ මද්‍යසාර පාලනය සම්බන්ධයෙන් ඇති නීති රීති මගින් නැගී එන සංචාරක කර්මාන්තය අධෛර්‍යමත් වන බව ප්‍රකාශ කරමින් පවතින නීති වෙනස්කර කරගැනීමේ වාසිය මහජනයාටත්, රජයටත්, විදේශ සංචාරකයන්ටත් හිමිනොවන බව කිවයුතුය. මේවා දිගින් දිගටම ප්‍රතිපත්ති සම්පාදකයන් නොමග යැවීමට යොදාගත් ප්‍රකාශයන් පමණක් වේ. සංචාරකයන්ට මද්‍යසාර භාවිතයට අවස්ථා සැලසිය යුතු නම්, රටේ සෑම තැබෑරුමක්ම ඕනෑම අවස්ථාවක විවෘතව තැබිය යුතුයැ'යි වැරදියට වටහාගත යුතු නැත. සංචාරක පදනම අනුව පමණක් මද්‍යසාර මිලදී ගැනීමට ක්‍රමවේද ඇතිකොට ක්‍රියාත්මක කරන රටවල් බොහෝමයක් තිබේ.

ඒ අනුව මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ගෙන ආ යෝජනාව හා එහි පසුබිම හදිසියේ ඇතිවූ එකක් නොව මීට පෙර ද අයවැය ඉදිපත් කිරීමට ආසන්න කාලයේදී මෙම ධූරයේ කටයුතු කළ අමාත්‍යවරුන්ටද කරන ලද බලපෑම් සහ නොමග යැවීම්වල ප්‍රතිඵලයකි. මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනෙක් මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිචාරයන්ද විශ්ලේෂණය කොට බැලූවිට මෙම යෝජනාවන් ක්‍රියාත්මකවීමෙන් වැඩියෙන්ම වාසි ලබන බියර් ඇතුළු තවත් මද්‍යසාර කර්මාන්තයන්ගේ කිසියම් හෝ බලපෑමක් ඔවුන්ට සිදුව ඇතිද යන සාධාරණ සැකය හටගනී.

පාර්ලිමේන්තුවට ගෙනා යෝජනාවන් බියර් කර්මාන්තය බොහෝ කාලයක් මුළුල්ලේ සිදුකරනු ලබන යෝජනා සමග සර්ව සමීප වේ. 2016 වසරේ අය වැය යෝජනා මගින්ද බදු පහසුකමක් ලබාදීමට යෝජනා වුවත් එය ක්‍රියාක්මක නොවීය. එහෙත් 2016 වසරේ ඇතිවූ ගං වතුර තත්වය නිසා සහනාධාරයක් ලෙස බියර් සමාගම විශාල ආනයන බදු සහනයක් ලබාගැනීමට සමත්විය.

රජයක මෙවන් ප්‍රතිපත්ති වෙනස්වීම් බහුතර පිරිසකගේ සුභ සිද්ධිය උදෙසා වියයුතු බැවින් මුදල් අමාත්‍යවරයා මෙවන් යෝජනාවක් පාර්ලිමේන්තුව හමුවේ තැබීමට පෙර දුම්කොළ, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පිහිටුවා ඇති කාර්‍ය සාධක බළකාය, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ හා සෞඛ්‍ය අමාත්‍යංශයේ ස්ථාවරයන් විමසීමට හැකියාව තිබිණි.

මෑතකදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර 2016. 05.20 දින ප්‍රකාශයට පත්කරන ලද මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනතද සැළකිල්ලට ගත යුතුව තිබූ බව සඳහන් කළයුතුමය. එවා යල්පැන ගිය ඒවා නොව ලෝකයේ මත්ද්‍රව්‍ය හා මද්‍යසාර පාලනය සම්බන්ධයෙන් යෝජිත ඵලදායි නිර්දේශයන් අඩංගු මාර්ගෝපදේශ වේ. මේ සියළු පාර්ශවයන්ගෙන් කරුණු විමසීමට හා අධ්‍යනයට තවදුරටත් ප්‍රමාද නොමැති බව අපගේ විශ්වාසයයි.

රජයක් ලෙස, මද්‍යසාර භාවිතාකරන 35% ක් තරම් පිරිසට කළ හැකි හොඳම උපකාරය ඔවුන්ගේ භාවිතය තව තවත් දිරිමත් කිරීම නොව එම භාවිතයෙන් ඉවත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීමයි. එම කාර්ය සඳහා සාධණීය ප්‍රතිපත්තීමය තීන්දු තීරණ ගැනීම සම්බන්ධයෙන් සිදුකරන මැදිහත්වීමකදී ලෝකයේ දැනට පවතින ඵලදායක බවට සනාථවී ඇති ප්‍රතිපත්තිමය තීරණ, විද්‍යාත්මක දත්ත හා තොරතුරු ලබාදීම මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය ලෙස අපගේ යුතුකම හා වගකීම වන අතර එය ඉටුකිරීමට අප සූදානමින් සිටින බව මෙහිදී ප්‍රකාශ කර සිටිමු.

ස්තූතියි,


මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය,
40/18 උද්‍යාන පාර, කොළඹ 05, දු:ක 0112 584416